ලෝක ළමා දිනය 2021

# "ළමා ලොව ජය ගනිමු- හෙට දිනට මග සදමු"



අවසන් වාර්තාව

තෙවන කණ්ඩායම

2021 ඔක්තෝබර් මස පළමුවැනිදාට අදාළව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාවේ අධ්‍යාපන නිවාරණ අංශය මගින් දීප ව්‍යාප්ත ළමා දින වැඩසටහනක් සිදුකරන ලදී. මෙය කණ්ඩායම් තුනක් විසින් අදියර තුනක් යටතේ සිදු කරන ලද අතර මෙම අවසන් වාර්තාව තුන්වන අදියරේ තෙවන කණ්ඩායම විසින් ඉදිරිපත් කරනු ලැබේ.

# ඔක්තෝම්බර් 1 වැනිදා ලෝක ළමා දින වැඩසටහන- 2021

## *"ළමා ලොව ජය ගනිමු- හෙට දිනට මඟ සදමු"*

(අවසන් වාර්තාව)

කණ්ඩායම - 03

**සමස්ත සාරාංශය**

- ළමා දින වැඩසටහන- 2021 ප.ව 4.30- ප.ව 6.30 (පැය 2කට පමණක් සීමාව තිබූ නමුත් ප.ව 6.37 වන විට නිමා විය.)
- සහභාගි වූවන් 120 කට ආසන්නය.
- ප.ව 3.30ට ප්‍රධාන ශ්‍රවණාගාරයට අදාළ නිලධාරීන් කණ්ඩායම රැස් විය.

වැඩසටහන පැවැත්වූ පැය දෙකකට ආසන්න කාලයේදී සහභාගි වූවන් ඉතා උද්යෝගයෙන් වැඩසටහනට සහභාගී වූ බව දක්නට ලැබුණි. මෙයට සහභාගි වූ දරුවන් බොහෝමයක් අවු. 5-12 අතරේ පසුවූවන් විය. උද්යෝගීභාවය සහ ඉදිරිපත් වීමේ හැකියාව අගය කළ නිසාවෙන්ම ගීත ගායනයට සහ අදහස් දැක්වීම සඳහා ළමයි 4 දෙනෙකුට ආසන්න ප්‍රමාණයකට අවස්ථාව ලබා දීමට සිදු විය. ඔවුන්ගේ නිර්මාණ සහ මෙම වැඩසටහන අගය කරමින් කොමිෂන් සභාව වෙත ලිපි whats up group හරහා එවා තිබුණි. (ඇමුණුම - 01)

එහි සාර්ථකත්වය ළමයින් හරහා මෙන්ම නිලධාරීන් තුළින් ද දැක්කෙමු. මෙම වැඩසටහන නිවාරණ අංශයේ මූලිකත්වයෙන් සිදු කළ ද කොමිෂන් සභාවේ සියලුම ඒකක වල කාර්යමණ්ඩලයන්හි සහ පරිපාලන නිලධාරීන්ගේ ද සහයෝගය හැකි උපරිමයෙන් ලද බවත් එම සියලු නිලධාරීන්ගේ නම් මෙහි සඳහන් කළ නොහැකි නිසාවෙන් එම පැය දෙක තුළ පරිශ්‍රයේ රැඳී සිටි නිලධාරීන්ගේ නම් පමණක් මෙහි දක්වා ඇත.

## සහභාගී වූ නිලධාරීන්

### තාක්ෂණික අංශය

- ✓ ප්‍රදීප් අමරජීව
- ✓ හර්ෂ මධුසංක
- ✓ තීක්ෂණ වික්‍රමතිලක
- ✓ තිළිණි කස්තුරි
- ✓ ශම්මි ශ්‍රී ලාල්
- ✓ අයෝධ්‍යා හේරත්
- ✓ ජයනි සෙනරත්

- ✓ කිව්දි කතිකා
- ✓ කමල් ජයසේකර

**මෙහෙයවීම**

| | |
|---|---|
| පූර්විකාව | චරක වික්‍රමසිංහ |
| ආරම්භක දේශනය | සහකාර අධ්‍යක්ෂක ජනරාල් දුෂ්මන්ති රාජපක්ෂ |
| COVID- 19 වසංගතයෙන් දරුවන්ට ඇති වන බලපෑම මගින් තර්ජනයට ලක්වන ළමා අයිතිවාසිකම් | විමුක්ති ජයසූරිය |
| ප්‍රායෝගික ක්‍රියාකාරකම්<br>• ලබා දෙනු ලබන නිවැරදි උපදෙස් පරිදි චිත්‍රයක් ඇඳ ඒ හරහා ගොඩනංවන කතිකාවත<br>• අනාගතයේ දී ළමයින්ගේ බලාපොරොත්තු පිළිබඳ කතිකාවත සහ ඔවුන් අභිප්‍රේරණය කිරීම | ඉෂානි විජේසූරිය |
| සුපිළිපන්නභාවයේ ප්‍රායෝගික බලපැවැත්ම | රුෂාන්ති දිල්ෂානි |
| • ළමයින්ගේ දක්ෂතා හා හැකියාවන් අගය කොට (ගීත ගායනය) ඒ සඳහා සුදුසු ළමයින් වෙත අවස්ථාව ලබා දීම<br>• වැඩසටහන පිළිබඳ අදහස් ලබා ගැනීම සහ ළමයින් අභිප්‍රේරණය, සාරාංශය | දිල්රුක්ෂි චන්ද්‍රසේකර |
| භාවාත්මක බුද්ධිය හා ගැටලු නිරාකරණය | දිනූෂා ලක්මාලි |
| සුපිළිපන්නභාවයේ මූලධර්මයන් පිළිබඳ සාකච්ඡාව | උදේශිකා මධුභාෂිනී |
| සාහිත්‍යයමය භාවාත්මක වින්දනය | නිපුනි තෙන්නකෝන් |
| ස්තූති කතාව | සංජීව හේරත් |

## වැඩසටහන මෙහෙය වූ දූෂණ නිවාරණ නිලධාරීන්ගේ භූමිකාව සහ වැඩසටහන සම්බන්ධ ඔවුන්ගේ අදහස්

මෙහිදී එම නිලධාරීන්, වැඩසටහන සම්බන්ධයෙන් දැක්වූ අදහස් ඔවුන් පැවසූ අයුරින්ම මෙහි සඳහන් කර ඇත්තේ, ඔවුන්ගේ ප්‍රකාශනයන්ට හානි නොවන අයුරිනි.

මෙම වැඩසටහනේදී මා හට සිදුකිරීමට වූ දේශනය විනාඩි 15ක් තුළ COVID- 19 වසංගතයෙන් දරුවන්ට ඇති වන බලපෑම මගින් තර්ජනයට ලක්වන ළමා අයිතිවාසිකම් පිළිබඳවයි. එහි දී,

- ලෝක ළමා දින තේමාව- COVID- 19 වසංගතයෙන් දරුවන්ට ඇති වන බලපෑම ආපසු හැරවීම සඳහා එක්සත් වන්න
- විශ්ව ළමා ප්‍රඥප්තිය 12/14 වගන්ති - සියලුම ළමුන්ට තමාට බලපාන ගැටලු සම්බන්ධයෙන් ජනමාධ්‍ය ඔස්සේ තම දැක්ම සහ හැඟීම් නිදහස්ව ප්‍රකාශනය කිරීමේ අයිතිවාසිකම පවතියි.
- COVID- 19 වසංගතයෙන් දරුවන්ට ඇති වන බලපෑම මගින් තර්ජනයට ලක්වන අයිතිවාසිකම්,

(පහත කරුණු *අධ්‍යාපනය, සෞඛ්‍ය, පෝෂණ සේවාවන් ,මානසික සෞඛ්‍යය, ළමා හිංසනය සහ ස්ත්‍රී/පුරුෂභාවය, ප්‍රචණ්ඩත්වය, සනීපාරක්ෂක ප්‍රවේශයන්, දිළිඳුකම, ගැටුම්, ව්‍යවසනයන් හා අවතැන්වීම්* මත ඉදිරිපත් කරන ලදී)

i. ඩිජිටල් තාක්ෂණයේ බෙදීයාම නවතමින් දරුවන්ගේ ***අධ්‍යාපනය*** සහතික කිරීම
ii. සෑම දරුවෙකු සඳහාම ***සෞඛ්‍ය, පෝෂණ සේවාවන්*** සඳහා ප්‍රවේශය ලබාදීමත් දැරිය හැකි වියදමකින් ළමයාට ***එන්නත්*** ලබා දීම
iii. ළමයින්ගේ ***මානසික සෞඛ්‍යට,ළමා හිංසනය සහ ස්ත්‍රී/පුරුෂභාවය*** පදනම් කර ගත් ***ප්‍රචණ්ඩත්වය*** අවම කිරීමට සහයෝගය ලබා දීම හා එවැනි ළමුන් ආරක්ෂා කිරීම
iv. ***පිරිසිදු ජලය,සනීපාරක්ෂක*** ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම හා ***පාරිසරික හායනය, දේශගුණික විපරියාසයන්*** අවම කිරීමට මඟ සැකසීම
v. ***දිළිඳුකම*** වර්ධනය වීම අවම කරමින් සැමට ප්‍රතිසාධනය සැළසීම
vi. ***ගැටුම්, ව්‍යවසනයන් හා අවතැන්වීම්*** වලින් ළමයින් සහ ඔවුන්ගේ පවුල් ආරක්ෂා කිරීම සහ සහය පළ කිරීම

දින තුනක් තුළ දී කණ්ඩායමක් ලෙස දරන ලද උපරිම උත්සාහය සාර්ථක වූ බව ප්‍රකාශ කරමි. එසේම කණ්ඩායමේ සාමාජිකයින් මා හට දැක්වූ සහය ඉතා අගය කොට සළකන අතර මා කෙරේ තැබූ විශ්වාසයට ද කෘතඥ වෙමි. එසේම සියලුම කණ්ඩායම් සාමාජිකයින්ගේ කැපවීම, උත්සාහය, නායකත්වයට ගරු කිරීම සහ සියලු අදහස් වලට ගෞරව කිරීම මෙන්ම කණ්ඩායම් හැඟීම ඉතා ගෞරවයෙන් අගය කොට සලකන අතර මෙම වැඩසටහන සාර්ථකව අවසන් වන තෙක් රැඳී සිට දැක්වූ සහයෝගයට ස්තුතිය පල කරමි. එසේම මේ සඳහා අවස්ථාව ලබා දුන් අධ්‍යාපන නිවාරණ අංශයේ ප්‍රධානි, නියෝජ්‍යය අධ්‍යක්ෂක ජනරාල් සුනේත්‍රා ජයසිංහ මිය, සහකාර නීති අධ්‍යක්ෂක දුෂ්මන්ති රාජපක්ෂ මිය ඇතුළු නන් අයුරින් සහයෝගය පළ කල කොමිෂන් සභාවේ සියලු නිලධාරීන්ට ද ස්තුතිය පල කරමි. **(එන්. විමුක්ති ජයසූරිය - දූෂණ නිවාරණ නිලධාරී )**

සුපිළිපන්න දරු පරපුරක් බිහි කරනු වස් ලෝක ළමා දිනය දා පැවති වැඩසටහනේ අප කණ්ඩායම තුළ මාගේ කාර්යභාරය වූයේ දුවා දරුවන්ට ක්‍රියාකාරකම් කිහිපයක් හඳුන්වා දෙමින් ඔවුන් හා සජීවීව එම ක්‍රියාකාරකම්වල යෙදීමයි.

''සවන් දෙමු - සිත්තම් මවමු'' යන ක්‍රියාකාරකම් තුළින් එතෙක් වෙලා දේශන කිහිපයකට සවන් දෙමින් සිටි දරුවන්ට යම් වෙනස් අත්දැකීමක් ලබා දීම හා අවධානයෙන් යුතුව සවන් දීමත් මෙසේ අඳින ලද රූපය තුළින් යම්කිසි පණිවුඩයක් දරුවන්ට ලබාදීමත් සිදුවිය.

මා මෙහෙය වූ දෙවෙනි ක්‍රියාකාරකම වූයේ ''හෙට දිනන අපි කවුද?'' යන්නයි. එමගින් දුවා දරුවන්ගේ අදහස් විමසමින් මනුෂ්‍යත්වයෙන් පිරිපුන් මිනිසෙකු වීමට ඔවුනට උපදෙස් ලබා දීම අප අරමුණ විය.

අප වැඩසටහන තුළ මා හට ලැබුණු කාර්යභාරය පිළිබඳ මා සතුටුවන අතර මට හැකි උපරිමය මාගේ කණ්ඩායමට ලබාදෙමින් අප වැඩසටහන ඉතා සාර්ථව ඉදිරියටත් පවත්වාගෙන යාමට හැකි වේවා යි මා ප්‍රාර්ථනා කරමි.

එකිනෙකාගේ භූමිකාවන් නිදහසේ කරගෙන යෑමට කණ්ඩායමේ සියලුම සාමාජිකාවන්ගෙන් ලැබෙන සහය ද ඉතා අගය කොට සලකමි. **(ඉෂානි විජේසූරිය- දූෂණ නිවාරණ නිලධාරී )**

මගේ තිබුණේ

සුපිළිපන්නබාවයේ කුළුණු 6,

- විශ්වාසත්‍යභාවය
- ගෞරවනීයත්වය
- වගකීම
- සමානාත්මතාවය
- සැළකීම
- පුරවැසිභාවය

ඒ වගේම ළමයෙක් තුළ සුපිළිපන්නභාවයට තිබිය යුතු ලක්ෂණ මොනවද කියල. සෘජු බව, නීතිගරුක බව, විනීත බව, ඉවසීම වැනි සුපිළිපන්නභාවය සහිත ළමයෙකුගේ ලක්ෂණනත් මගේ කතාව ඇතුළින් ළමයින්ට කියලා දුන්නා. මං යොදාගත්ත උදාහරණ තමයි ඒබ්‍රහම් ලින්කන් ජනාධිපතිතුමා තමන්ගෙ පුතාගෙ ගුරුතුමාට ලිව්ව ලිපිය හා කුමාරතුංග මුනිදාසයන්ගේ සිරිමත් කවි පංතිය.

මං හිතන්නේ අපිත් අපේ ළමා ලෝකයට ගියා වගේ.එයාල ප්‍රශ්නවලට උත්තර දෙද්දි හිතුනෙ එයාල අපිට වඩා ඉස්සරහින් ඉන්නවා කියල. ඒ වගේම එයාලගේ පරිකල්පන හැකියාව ගොඩක් දියුණුයි වගේම වෙනස් කියල. මොන භෞතික වස්තුවද වෙන්නද එයාලා කැමති කියලා ඇහුවම එයාලා දුන්නු උත්තර අපිව ගොඩක් පුදුම කළා.

උදා; පොල් ගසක් වෙන්න ඕනි කියන එක, ලුණු වෙන්න ඕනි කියන එක

ඒ වගේම එයාලගේ ඉදිරිපත් වීමේ හැකියාවත් මාරම ඉහළයි. ප්‍රශ්නයක් ඇහුවම අත උස්සනවා ගොඩක් අය.දුකයි හැමෝටම අවස්ථාව දෙන්න බැරි වෙන එකට. මං හිතන්නේ පාසල් ළමයින්ට අපි දිගටම මේ වගේ ඒවා කරන්න ඕනි. අපි සුපිළිපන්න අනාගත පරපුරක් බිහිකරන්න අනිවාර්යයෙන්ම පුළුවන් වෙයි.

ඒත් එක්කම මේ වෙද්දි අපි කණ්ඩායමක් විදිහට ගොඩක් එකමුතුව වැඩ කල නිසා අපි මේ විදිහට සාර්ථකම කණ්ඩායම බවට පත් වුනේ.

ඔන්න ඔය ටික තමයි මගේ අදහස. **(උදේශිකා මධුෂානි - දූෂණ නිවාරණ නිලධාරී )**

ලෝක ළමා දිනය මුල් කරගනිමින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාවේ දූෂණ නිවාරණ ඒකකය මගින් දීප ව්‍යාප්තව ළමුන් සම්බන්ධ කරගනිමින් මාර්ගගත ක්‍රමය ඔස්සේ 2021.ඔක්තෝබර් මස පළමුවැනි දින පැවැත් වූ වැඩසටහන් මාලාව ඉතා සාර්ථකව නිමා වූ බව මාගේ අදහසයි. කෙටි කාලසීමාවක දී අපට මෙම වැඩසටහන් සියල්ල සිදු කිරීමට සිදු වූයේ කිසිදු පෙර පුහුණුවීම් ද නොමැතිවය. නමුත් යෝධ සෙවනැල්ලක් සේ, නොසැලෙන නායකත්වයක් අප සමඟ නිරන්තරයෙන් සිටිම හේතුවෙන් අපට අපගේ අරමුණ නොසිතූ පරිදි ඉටු වීම සතුටට කරුණකි.

නිවැරදි නායකත්වය තුළින් එකමුතු බව, විශ්වසනියත්වය හා එකිනෙකා අතර සබඳතා නිවැරදිව පවත්වා ගැනිමට අවශ්‍ය පසුබිම නිතර නිර්මාණය කර දෙන්නට විය. එකිනෙකා පසුකර යාමට නොව ගලන ගඟක් සේ සියල්ලෝම එකම මගක යාමටත් අපගේ හැකියාව අපට නිවැරදිව හඳුනා ගැනීමටත් මෙම වැඩසටහන් හේතු විය. සමස්ත ලෝක වැඩසටහන් මාලාව ආයතනයේ සියලු දෙනාගේ ම දායකත්වය මත අති සාර්ථකව නිමා වූ බව මාගේ මතයයි.

ලෝක ළමා දිනයේ අවසාන වැඩසටහන දූෂණ නිවාරණ නිලධාරිනියන් හත් දෙනෙකුගේ සහභාගිත්වයෙන් සිදු වූ අතර අප අතරේ ද හොඳ එකමුතුවක් තිබීම ඉතා වැදගත් කරුණකි. දින 02ක් තුළ නිර්මාණශීලී හා සාර්ථක වැඩසටහනක් කිරීමට අවශ්‍ය පසුබිම සැකසීමට අප හත් දෙනා අතර ද නිවැරදි එක් නායකයෙක් සිටීම කිව යුතුමය. එසේ ම අපගේ වැඩසටහන තුළ මා හට පැවරුණු වගකීම මා උපරිමයෙන් කළ අතර අනෙක් සියල්ලෝ ද එය නිසි පරිදි ඉටු කළ බව මාගේ අදහසයි.

භාවාත්මක බුද්ධිය සම්බන්ධ අංගයේ සාරාංශය,

- භාවාත්මක බුද්ධිය හඳුන්වා දීම.
- IQ හා EQ අතර පවතින වෙනස හා EQ පිළිබඳ ලෝකයේ මතය පැහැදිලි කිරිම.
- භාවාත්මක බුද්ධිය ප්‍රගුණ කළ හැකි ආකාර නිදසුන් ඇසුරින් පැහැදිලි කිරිම.
- භාවාත්මක බුද්ධිය හා සම්බන්ධ ගැටළු ඉදිරිපත් කර ළමයාගේ භාවාත්මක බුද්ධිය නිරීක්ෂණය කිරිම. **(දිනූෂා ලක්මාලි- දූෂණ නිවාරණ නිලධාරී)**

මුළු මහත් ලෝකයම ව්‍යසන තත්ත්වයක පවතින අවස්ථාවේ නිවසටම කොටු වී ඒකාකාරීව සිටින පුංචි පොඩිත්තන් වෙනුවෙන් 2021 ලෝක ළමා දිනය හරවත් හා විනෝදකාමී අයුරින් පුංචි දූවා දරුවන්ට සමීප කරවන්නට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව ගත් උත්සාහය අතිසාර්ථක විය. මන්ද යත් වැඩසටහන් අවසානයේ ඒ සඳහා ලද ප්‍රතිචාර ඊට හොඳම සාක්ෂි සපයයි. බඳවා ගත් නවක දූෂණ නිවාරණ නිලධාරීන් විසින් මෙහෙයවන ලද මෙම වැඩසටහන් ත්‍රිත්වය පුංචි දූවා දරුවන්ට විවිධාකාරයේ අත්දැකීම් සමීප කරවන්නක් විය.

ඒ අතරින් මාගේ සම්පත්දායකත්වය ලබා දුන් 4.30 - 6.30 ලෝක ළමා දින වැඩසටහන අතිසාර්ථකත්වයට පත් වු බව මාගේ අදහසයි. පුංචි දූවා දරුවන් 150ට ආසන්න ප්‍රමාණයකගේ සක්‍රීය දායකත්වයෙන් නිම කරගන්නට හැකි වූ මෙම වැඩසටහන දරුවන්ට හා අප සියල්ලන්ටම පාහේ නවමු වෙනස් අත්දැකීමක් විය. නිවාරණ නිළධාරීන් හත් දෙනෙකුගේ සහභාගීත්වයෙන් දරුවන් ප්‍රායෝගිකව වැඩසටහනට සම්බන්ධ කරගන්නා අතරතුර දැනුම, ආකල්ප, සාරධර්ම පුංචි හිත් තුළ රෝපණය කරන්නට ඉන් සමත් වීම අප ලද ජයග්‍රහණය විය.

එහි දී මවිසින් දූවා දරුවන්ට සුපිළිපන්න සංකල්පය පැහැදිලි කරන්නට යෙදුන අතර එය සරලව හා සජීවී අයුරින් දරුවන්ට ඒත්තු ගැන්වීමට මම උත්සාහ කළෙමි. පුංචි පොඩිත්තන්ගේ ලෝකයට සමීප කාටුන් හා වීඩියෝ පටයක් මගින් වටිනා සාරධර්මයක් දරුවන්ට කියාදීමට ලැබීම මම ඉතා අගය කොට සලකමි. එසේ ම සරල උදාහරණ ඇසුරින් එය දරුවන්ට සමීප කරවීමෙන් මා සාර්ථක වූ බව මාගේ විශ්වාසයයි.

තවදුරටත් අප නිලධාරිනියන් හත්දෙනාම විසින් සිදු කරන ලද සියලු විවිධාකාර වු දේශනයන් පුංචි පොඩිත්තන් ආදරයෙන් වැළඳගත් ආකාරය අපි එවෙලෙහිම සජීවීව දුටුවෙමු. පසුව පොඩිත්තන්ගෙන් ඒ සඳහා ලද ඇගයුම් මගින් එය තවදුරටත් සනාථ විය. කරුණු එසේ හෙයින් 2021 ලෝක ළමා දිනය නිමිති කොට ගෙන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ දූෂණ නිවාරණ නිලධාරීන් වන අප සිදු කළ වැඩසටහන සාර්ථක වූ බව මාගේ විශ්වාසයයි.

- සුපිළිපන්නභාවය යනු,
- කවුරු බලන් හිටියත් නැතත් හිතට අවංකව සැම විටම නිවැරදි දේ කිරීම සුපිළිපන්නබාවයයි.
- සුපිළිපන්න පුද්ගලයෙකු ප්‍රායෝගිකව හඳුනා ගන්නේ කෙසේ ද?

(ප්‍රධාන ලක්ෂණ 4ක් ඇසුරෙන්)

1. සැම විටම නිවැරදි තෝරා ගැනීම සිදු කරයි.
2. සුපිළිපන්නබාවය ඇති වීමට බලහත්කාරයෙන් පුරුදු පුහුණු කල යුතු නැත.
3. සුපිළිපන්න පුද්ගලයා සැම විටම උපතේ පටන් නිවැරදි ම දේ කළ අය නොවේ. ඕනෑම අයෙකුට හිතට එකඟව සුපිළිපන්නබාවය ඇති කරගත හැක.

4. සුපිළිපන්න පුද්ගලයා වරද දුටු තැන එරෙහි වෙයි. වරදක ගලා යාම නිසැකවම බණ්ඩනය කරයි. (වීඩියෝ පට දෙකක් ඇසුරින් පැහැදිලි කරයි.) **(රුෂාන්ති දිල්ශානි- දූෂණ නිවාරණ නිලධාරී)**

අද වන විට මුළු මහත් ලෝකයක් වෙලාගෙන පවතින කොවිඩ් ව්‍යසනය අබිමුව වඩාත් ම බලපෑමට ලක්ව ඇත්තේ අපේ පුංචි දූවා දරුවන් ය. පාසල වෙත ගොස් සිප් සතර හදාරා සිය යහළුවන් සමගින් දුව පැන සෙල්ලම් කර ගහකොළ හා සතා සීපාව සමගින් කාලය ගත කරනවා වෙනුවට නිවස තුලටම සිර වූ ඒකාකාරී රාමුවක අද දින ඔවුන්ගේ සුන්දරතම ළමා කාලය ගෙවීයයි. මෙවන් පරිසරයක් තුළ අපේ දූවා දරුවන් උදෙසා 2021 ලෝක ළමා දිනය වෙනුවෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් සංවිධනය කරනු ලැබූ දැනුම හා විනෝදය රැගත් වැඩසටහන් මාලාව මහගු කැපකිරීම් රැසක සාර්ථක මල්ඵල දැරීමකි. අප හා සජීවීව එක් වූ ආදරණීය දූ පුතුන්ගේ මුව පිරි සිනාවන් හා මුසු වූ උද්යෝගිමත් සහභාගීත්වය මෙන් ම නන් දෙසින් අප ලැබූ හාදයාංගම ප්‍රතිචාරයන් එය සනාථ කරනු ලැබීය. දහසකුත් කැපකිරීම්, නිවැරදි නායකත්වයන් හා සහෝදරත්වය හා එක්ව නවක දූෂණ නිලධාරීන් ලෙස අප මේ තැබූ පියවර අතිසාර්ථක බව පැහැදිලිය.

මෙම වැඩසටහන් මාලාවේ තෙවන අදියර ලෙස ප.ව 4.30 සිට 6.30 දක්වා වූ වැඩසටහන නවක දූෂණ නිලධාරීන් හත්දෙනෙකුගේ සහභාගිත්වයෙන් සිදු කරනු ලැබීය. මා ද ඒ අතරින් එක් අයෙකි. ඉතා කෙටි කාලයක් තුළ මනා සංවිධානයකින් යුතුව, පැහැදිලි මගපෙන්වීම, අනොන්‍ය සුහදතාවය හා සහෝදරත්වය තුළ අප අපගේ වැඩසටහන ඉතා සාර්ථක කරගත් බව මම විශ්වාස කරමි. එමෙන්ම දැනුම හා විනෝදයට පමණක් සීමා නොවී හෙට දින ලොව භාර ගැනුමට සිටිනා අපේ පුංචි දරුවන් හෘදයාංගම මිනිසෙකු ලෙස තැනුමට අවැසි යහගුණයන්ගෙන් ඔවුන් සුපෝෂණය කිරීමට අවැසි මග පෙන්වීම ද කිරීමට අප මෙහිදී උත්සාහ ගත්තෙමු.

**සිහින දකිමු - සිහින සැබෑ කරගමු.**

අපගේ වැඩසටහන තුල සිහින දකිමු - සිහින සැබෑ කරගමු යන තේමාව ඔස්සේ මා දරුවන් ඇමතීය. මේ තුළ දරුවන්ට අරමුණක් ඇතිව ජීවිතය දිනුමට අවැසි මග විවර කිරීම අපේක්ෂාව විය. පවතින කොවිඩ් ව්‍යසනය හමුවේ රාමුගතව සිටින දරුවන්ගේ කඩාවැටී ඇති මනස නැවත ප්‍රබෝධාත්මකව අවදි කරමින් විසිර පවත්නා සිතැගි එක්තැන් කරමින් ඔවුන් දුටු සහ දකින සිහින තුළට නැවත රැගෙන යාමයි. සිහින දැකීමට පමණක් නොව තමන් හෙට දවසේ පිවිසීමට අපේක්ෂිත සාර්ථක අනාගතයට අද දකින සිහින අත්තිවාරමක් වන බව පැහැදිලි කිරීමට මෙහි දී බලාපොරොත්තු විය. සිහින ලුහුබැඳ යාමට සහ යථාර්ථයක් කරගැනීමට දිරිගැන්වීම මෙන් ම අද දකින සිහින මනාව සැලසුම් කර හෙට දවස ජයගැනුමට මේ කාලය උපරිම ඵලදායීව යොමු කරන්න යන පණිවිඩය ලබාදීම ද මෙහි දී සිදු කරලු ලැබීය.

- සිහින ගැන හඳුන්වා දීම හා එහි වැදගත්කම
- ප්‍රසිද්ධ පුද්ගලයන් විසින් සිහින ගැන දක්වා ඇති අදහස්

- පවතින තත්ත්වය හමුවේ අධෛර්යමත්ව ඇති, ඒකාකාරි වී ඇති දරුවන් හට නැවත තම සිහිනයන් වෙනුවෙන් වැඩ කිරීමට, ඒවා සැලසුම් කිරීමට දිරිගැන්වීම.
- දරුවන් දකින සිහිනවලට ආදරය, කරුණාව වැනි හෘදයාංගම ගුණාංග ද මුසු කරගැනීමේ ඇති වැදගත්කම පෙන්වා දීම තුළ හෘදයාංගම මිනිසෙකු බිහි කිරීමට මග විවර කිරීම.
- ''යං යං හීනය'' ගීතය තුළින් ඔවුන් හා සමාන දරුවකු සිහින සැබෑ කරගැනීමට දරනා උත්සාහය , ඔහුගේ සිතුවිලි පිළිබඳ අදහස දරුවන් තුළට කාවැද්දීම.
- (ආරම්භයේ දී ගීතයක් ඇසීමට සැලැස්වීම මගින් දරුවන් තුළ ජාත්‍යාලය පිළිබඳ හැඟීම ඇති කිරීමට උත්සාහ කළා. එහි දී හෙට දවසේ ලොව දිනා ලක්මව බැබළවීම පුංචි ළමුන් සතු කාර්යයක් බව සිතට කාවැද්දීමට අපේක්ෂා කල නමුත් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණි,)
**(නිපුණි තෙන්නකෝන් - දූෂණ නිවාරණ නිලධාරී)**

ප.ව 4.50 - 4.55 සඳහා වෙන් වූ කාලයේ දී ගීත ගායනය සඳහා අවස්ථාව ලබා දීම,

1. අපිත් එක්ක අද දුවලා පුතාලා ගොඩක් සම්බන්ධ වෙලා ඉන්නවා.
2. ඉතින් අපි එක්කෙනෙක්ට පුංචි අවස්ථාවක් දෙන්නයි හදන්නේ.
3. ඒ මොකක්ද දන්නවද පුතේ ඔයාලගේ එක පුතෙක්ට හරි දුවෙක්ට හරි පුළුවන් අපි ඔක්කොටම
4. ඇහෙන්න සිංදුවක් කියන්න.
5. සිංදුවක් කියන්න කැමති දුවෙක් හරි පුතෙක් හරි ඉන්නවා නම් Raise hand කියලා තියන / අතක්
6. වගේ Symbol එකෙන් අපිට කියන්න. අපි ඒ පුතාට අවස්ථාව ලබා දෙනවා. අපිට Chat box එකට
7. කැමතියි කියලා දාන්නත් පුළුවන්. මුලින්ම ඉදිරිපත් වෙන කෙනාට තමයි අවස්ථාව දෙන්නේ.
8. අපි බලමු දැන් කවුද මුලින්ම ඉදිරිපත් වෙන්නේ කියලා.
9. ඔන්න _නම_ පුතා හෝ දුව තමයි මේ අවස්ථාව ලබා ගන්නේ.

Video දර්ශනය විකාශය කෙරුණි

10. හරි පුතේ කියන්න බලන්න ඔයාගේ සම්පූර්ණ නම, පාසල,ගම කොහෙද කියලා.
11. හරි පුතේ දැන් අපි ඔයාට අවස්ථාව දෙනවා සිංදුව කියන්න.
12. හරිම ලස්සන සිංදුවක්. බොහොම ස්තුතිය පුතේ.
13. සිංදුවේ විචාරය -

ප.ව 5.55 - 5.5  කාලය තුළ වැඩසටහන පිළිබඳව අදහස් ලබා ගැනීම

- පුතේ ඔයාල දැන් පැය 2කට ආසන්න ප්‍රමාණයක් අපිත් එක්ක හිටියා. ඔයාල දැන් පුංචි සුපිළිපන්න දරුවෝ. නේද පුතේ,
- Msg එක
- අපේ වැඩසටහන ගැන ඔයාලට මොනවද හිතෙන්නේ කියලා අපිට කියන්න. ඔයාල ඒක කොලයක ලියලා Photo එකක් ගහලා අපි ඔයාලට email එවපු address එකට එවන්න ඕනි.
- අමතක කරන්න එපා පුතේ අපි ඔයාලට සහතිකයකුත් දෙනවනේ. ඒ නිසා ඔයාලගේ සම්පූර්ණ නම, සහතිකය එන්න ඕනි Address එක, අම්මගේ හරි තාත්තගේ හරි Phone no එකත් අපිට ඒ  එක්කම email කරලා එවන්න ඕනි. පුතේ අපි ඔයාලගේ සහතිකය post එකේ එවනවා.
- පුතේ දැන් ඔයාලට සංජීව මාමා කතා කරන්න ලෑස්ති වෙලා ඉන්නවා.

**(දිල්රුක්ෂි චන්ද්‍රසේකර- දූෂණ නිවාරණ නිලධාරී)**

ඇමුණුම - 1

# වැඩසටහනට සහභාගී වූ දරුවන්ගේ අදහස්






## වැඩසටහනේ අංග ඇසුරින් ඉදිරිපත් කරන ලද නිර්මාණ කිහිපයක්










## වැඩසටහනට සහභාගි වූ දරුවන්ගේ නිර්මාණ කිහිපයක්














වැඩසටහනේ කැමරා දසුන්




2021 ඔක්තෝබර් පළමුවැනිදා වැඩසටහන් මාලාව මෙහෙය වූ අධ්‍යාපන නිවාරණ ඒකකයේ නිලධාරීන්






HONEST PUBLIC OFFICER
YOU ARE
GIFT TO OUR
MOTHERLAND!
CIABOC
PRIDE
COMMISSION TO INVESTIGATE
ALLEGATION OF
BRIBERY OR CORRUPTION
HOT LINE : 1954




PRIDE
COMMISSION TO INVESTIGATE
ALLEGATION OF
BRIBERY OR CORRUPTION
HOT LINE : 1954
PRIDE
අල්ලස් හෝ දූෂණ
චෝදනා විමර්ශන
කොමිෂන් සභාව
ක්ෂණික ඇමතුම - 1954


COMMISSION TO INVESTIGATE ALLEGATION OF BRIBERY OR CORRUPTION
HOT LINE : 1954
සිහින්
උණගස්
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
ක්ෂණික ඇමතුම - 1954
Participants
Chat
Share Screen
Record
Reactions
Apps


REC
COMMISSION TO INVESTIGATE
සිහින්
උණගස්
නොවැටේය
සුළි සුළඟට..
සසලව,
එකසරව..
උණ ගස
CIABOC Bribery Commission


HONEST PUBLIC OFFICER
YOU ARE
A GIFT TO OUR
MOTHERLAND!
CIABOC
PRIDE
COMMISSION TO INVESTIGATE
ALLEGATION OF
BRIBERY OR CORRUPTION
HOT LINE : 1954
සුපිළිපන්න රාජ්‍ය
සේවකයෙක් වන
ඔබ
රටට දායාදයකි!


YOU ARE
A GIFT TO OUR
CIABOC
PRIDE
ALLEGATION OF
HOT LINE : 1954
උඩගු
මහගස්
නොනැමේය
සියුම් සුළඟට..
සිහින්
උණගස්
නොවැටේය
සුළි සුළඟට..
සුපිළිපන්න රාජ්‍ය
සේවකයෙක් වන
ඔබ
රටට දායාදයකි!
CIABOC
PRIDE
අල්ලස් හෝ දූෂණ
චෝදනා විමර්ශන
කොමිෂන් සභාව
ක්ෂණික ඇමතුම - 1954


ගිල දමනු වස්
ගම් බිම්
බියපත්ව
සැලෙත්දී
මහගස්..
සන්සුන්ය
උණගස
සුරකීය
ගංදෑල..
HONEST PUBLIC OFFICER
YOU ARE
A GIFT TO OUR
MOTHERLAND!
සුපිළිපන්න රාජ්‍ය
සේවකයෙක් වන
ඔබ
රටට දායාදයකි!
CIABOC
PRIDE
අල්ලස් හෝ දූෂණ
චෝදනා විමර්ශන
කොමිෂන් සභාව
ක්ෂණික ඇමතුම - 1954


HONEST PUBLIC OFFICER
YOU ARE
A GIFT TO OUR
MOTHERLAND!
CIABOC
PRIDE
COMMISSION TO INVESTIGATE
සුපිළිපන්න රාජ්‍ය
සේවකයෙක් වන
ඔබ
රටට දායාදයකි!
CIABOC
PRIDE
අල්ලස් හෝ දූෂණ
චෝදනා විමර්ශන
කොමිෂන් සභාව



ගිල දමනු වස්
ගම් බිම්
බියපත්ව
මහගස්..
උණගස
HONEST PUBLIC
YOU ARE
A GIFT TO OUR
MOTHERLAND
COMMISSION TO
BRIBERY OR
සුපිළිපන්න රාජ්‍ය
සේවකයෙක් වන
ඔබ
රටට දායාදයකි!
CIABOC
PRIDE
අල්ලස් හෝ දූෂණ
චෝදනා විමර්ශන
කොමිෂන් සභාව
සභාපතිතුමා - 1954


CIABOC
PRIDE
COMMISSION TO INVESTIGATE ALLEGATION OF BRIBERY OR CORRUPTION
HOT LINE : 1954
CIABOC
PRIDE


CIABOC
PRIDE
HOT LINE : 1954


CIABOC
CIABOC




CIABOC




CIABOC
acer



දරුවෙනි නුඹට,

හෙටක් තනන්නට

වෙර දරන,

අර අදින.....

අපි...

නුඹෙන් පතන්නේ..

අල්ලස නැති,

දූෂණය නැති....

රටකට ඇවැසි,

**" සුපිළිපන්න " දරුවෙක්** ය.

ඔව්...ඒ,

නුඹම පමණක්මය.